# කරුණානිධි රජිව්ගේ මිනීමරුවා රැකීම

අපට වෙච්ච දේ හා ඉන් ගොඩ එම මැයෙන් ලියන ලිපි පෙළ මේ සතියේ පළ නොවන්නේ කරුණානිධිගේ දේශපාලන උප්පරවැට්ටි සාකච්ඡා කළ යුතු බැවිනි. අප රැකගන්නා ලෙස ඉල්ලමින් ටික කලකට පෙර ඉන්දීය මහකොමසාරිස් හමුවීමට ගිය ඇතැම්හු අද ඉන්දියාවට විරුද්ධව පෝස්ටර අලවති. තවත් සමහරු ඉන්දියාවට විරුද්ධව උද්ඝෝෂණ පවත්වති. රටක ප්‍රතිපත්ති කලින් කලට වෙනස්වන බැවින් ඒ රට ගැන දරණ ආකල්ප ද වෙනස්විය හැකි බව මෙහි දී ඔවුන්ට තම ගැලවීම සඳහා පෙන්වා දිය හැකි ය. එහෙත් ඉන්දියාව රටක් ලෙසවත් තමිල්නාඩුව ප්‍රාන්තයක් ලෙසවත් ප්‍රභාකරන් රැකගැනීමට ඉදිරිපත් වේ යැයි සිතිය නො හැකි ය. ඉන්දියාව වෙනත් ආකාරයකට හෝ මැදිහත් නොකර තබාගැනීම ලංකාණ්ඩුවට භාර ය. තමිල්නාඩුවට ප්‍රාන්තයක් ලෙස එලෙස කටයුතුකිරීමට තරම් ස්වාධීනත්වයක් ද නැති බව අමතක නොකළ යුතු ය.

මෙයින් කියැවෙන්නේ ඉන්දියාව ලංකාවට පක්ෂපාතී බවවත් කිසිම කොන්දේසියක් යටතේ ඉන්දියාව නිසොල්මනේ සිටින බවවත් නො වෙයි. ඉන්දියාව, එනම් එය පාලනය කරන බමුණු පෙලැන්තිය ප්‍රසිද්ධියේ කුමක් ප්‍රකාශ කළද යටින් ලංකාවට විරුද්ධ ය. සිංහලයන්ට විරුද්ධ ය. එසේ වුවත් ඉන්දියාව මැදිහත් නොකර තබාගැනීමට ලංකාවට හැකිවිය යුතු ය. රාජ්‍ය තන්ත්‍රික භාවය අවශ්‍යවන්නේ එහි දී ය.

ඉන්දියාව අද ඇමරිකාවට විරුද්ධව කිසිවක් නො කරයි. එහෙත් ඇමරිකාව කී පමණින් ද ඉන්දියාව යමක් නො කරයි. ඉන්දියාව තවමත් ඇමරිකාවේ බළල් අතක් නො වෙයි. බැරක් ඔබාමා මහතා ඇමරිකාවේ මීළඟ ජනාධිපති වීමට වැඩි ඉඩ කඩක් වෙයි. කල්ලකු නොව කළු සුද්දකු වූ ඔහුට ඇමරිකන් මධ්‍යම පංතිය දැන් වඩාත් කැමතිවනු ඇත්තේ ඔහු සංස්කෘතිකව මුළුමනින් ම යුදෙව් ක්‍රිස්තියානි වීම නිසාත් ඇමරිකන් ආර්ථිකය  මුහුණ පා ඇති මූල්‍ය අර්බුදයෙන් ඒ ගලවාගැනීමට මූල්‍ය කටයුතුවල දී යම් ප්‍රමාණයකින්වත් රාජ්‍යයේ මැදිහත්වීම අනුමතකරන ඩිමොක්‍රටික් පක්ෂය බලයේ සිටීම යහපත් යැයි සිතන නිසාත් ය.

එහෙත් ඔබාමා මහතා හා ඩිමොක්‍රටික් පක්ෂය දෙමළ ජාතිවාදයට වඩාත් පක්ෂපාතී වනු ඇත. කොටි සංවිධානය ඇමරිකාවේ තහනම් කර ඇති නමුත් ලංකාවේ දී කොටි සංවිධානය ආරක්ෂාකිරීමට ඇමරිකාවට අවශ්‍ය වුවහොත් ඔවුන් එසේ නොකර නොසිටිනු ඇත. ඇතැම් විට ඔවුන් එවැනි අවස්ථාවක ඉන්දියාවේ සහාය පැතීමට ඉඩ ඇත. ඒ කුමක් වුවත් අද ලංකාණ්ඩුවේ කාර්යභාරය වනුයේ කිසිම විදේශීය රටකට ප්‍රශ්නයට මැදිහත්වීමට කිසිදු ඉඩක් ලබා නො දීම ය. ඒ කළ නොහැක්කක් නො වේ.

ලංකාණ්ඩුව මෙයට වඩා ප්‍රචාරක කටයුතුවල නිළුත විය යුතු ය. එසේ කළ යුතු වන්නේ බටහිරයන්ට හෝ ඉන්දියාවට හෝ කරුණු එත්තුගැන්වීමට නො වෙයි. ලංකාණ්ඩුව මෙන් සතුරන්ට සළකන ආණ්ඩුවක් ලෝකයේ කොහේවත් නොමැති බව ඔවුහු සියල්ලෝ ම දනිති. ආණ්ඩුව කොටින්ට ද අද ආහාර පමණක් නොව බෙහෙත් ද සපයයි. කොටි රජයේ රෝහල්වල ප්‍රතිකාර ලබති. එසේ නම් ආණ්ඩුව සාමාන්‍ය ජනතාවට නොසලකා සිටින්නේ යැයි කිසිවකුට කිවහැකි නො වෙයි. ආණ්ඩුව කිලිනොච්චිය හා අවට ප්‍රදේශවල වැසියන්ට ආහාර හා වෙනත් අවශ්‍ය ද්‍රව්‍ය ලොරි පිටින් යවන බව බටහිර රටවල් මෙන් ම ඉන්දියාව ද දනියි. එලෙස ආහාර පටවා යවන ලොරි හා වෙනත් රථවලට කොටි පහර දෙති.  එහෙත් ඔවුන්ට ඒ බව නොදන්නවා මෙන් සිටිය හැකි ය. ලංකාණ්ඩුව කළ යුත්තේ ඔවුන්ට ඒ බව නොදන්නවා මෙන් සිටීමට ඉඩ නො දීම ය. ප්‍රචාරය අවශ්‍ය වන්නේ ඒ සඳහා ය. විදේශීය ජනමාධ්‍ය ද අවශ්‍ය පරිදි යොදාගැනීමට ආණ්ඩුවට හැකිවිය යුතු ය.

එහෙත් එයට ද වඩා ඉන්දියාවේ ප්‍රචාරය කළ යුත්තේ කරුණානිධිගේ දේශපාලන උප්පරවැට්ටි ය. කරුණානිධි අද කෙලින් ම ප්‍රභාකරන් වෙනුවෙන් පෙනී සිටියි. ඔහු කටයුතු කරන්නේ මීළඟ මැතිවරණය දෙස ඇස ගසාගෙන පමණක් නො වේ. ඔහුට ප්‍රභාකරන් බේරා ගැනීමේ අවශ්‍යතාවක් ද වෙයි. අද ප්‍රභාකරන් බේරාගත හැක්කේ ඉන්දීය හමුදා මැදිහත් කිරීමෙනි. ඉන්දීය හමුදා කිසිම හේතුවක් නැතිව මැදිහත් කරවීමට නොහැකි බව කරුණානිධි නොදන්නවා නො වේ. එබැවින් අද කරුණානිධිට අවශ්‍ය වන්නේ එවැනි හේතුවක් හෝ හේතු හෝ  නිර්මාණය කිරීම ය.

© Prof. Nalin De Silva

කරුණානිධි කිලිනොච්චියේ අහිංසක දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නය ගැන කතාකරන්නේ එබැවිනි. ඉන්දීය ආණ්ඩුවට ඒ ඇම ගිල්ලවීමට නොහැකි නම් ඔහු වෙනත් උපාය සොයනු ඇත. ඉන්දීය ආණ්ඩුව මැදිහත් කරවීම සඳහා ඉන්දීය පුරවැසියන් බිල්ලට දීමට පවා කරුණානිධි පසුබට නොවනු ඇත. කරුණානිධි යනු තමිල්නාඩුව නොවන බව අප අමතක කළයුතු නො වෙයි. තමිල්නාඩුවේ ජයලලිතා මහත්මිය පවා කරුණානිධිගේ උප්පරවැට්ටිවලට විරුද්ධ ය. ලංකාණ්ඩුවට ඉන්දියාවේ දී ප්‍රචාරක කටයුතු සඳහා යොදාගත හැකි හොඳම ප්‍රාන්තය ද තමිල්නාඩුව විය හැකි ය.

කරුණානිධි ලංකාව ගැන දන්නා දෙයක් නැත. අඩුම තරමින් ඔහු නොදන්නා බව පෙන්වා ඇත. ලංකාණ්ඩුව නැගෙනහිර පළාතේ දෙමළ ජනයා වෙනුවෙන් පසුගිය කාලයේ කර ඇති සේවය දැක බලාගැනීමට කරුනානිධිට බැරි නම් ජයලලිතා මහත්මියට මෙහි පැමිණෙන ලෙස ආරාධනය කළ හැකි ය. ආනන්දසංගරී මහතාගේ සිට මුරලිදරන් හෙවත් කරුණා දක්වා විවිධ දෙමළ දේශපාලනඥයන් උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ දෙමළ ජනයා වෙනුවෙන් ලංකාණ්ඩුව කර ඇති සේවය සම්බන්ධයෙන් කරන ප්‍රකාශ තමිල්නාඩුවේ දැනට වඩා ප්‍රචාරය විය යුතු ය.

කරුණානිධිට ලංකාවේ දෙමළ ජනයා ගැන එතරම් කැක්කුමක් තිබේ නම් ඔහු කළ යුත්තේ ප්‍රභාකරන් අහිංසක දෙමළ ළමයින්ට, මහල්ලන්ට, කාන්තාවන්ට අවි ආයුධ පුහුණුවක් ලබා දී ලංකාණ්ඩුවේ හමුදාවන්ට විරුද්ධව සටන්කිරීමට යැවීම වැළැක්වීමට කටයුතු කිරීම ය. එමෙන් ම ප්‍රභාකරන් දෙමළ ජනයා මිනිස් පළිහක් ලෙස යොදාගැනීම වැළැක්වීමට පියවර ගැනීම ය. එහෙත් ඔහු ඒ එකක්වත් නොකරයි. ඔහුට අවශ්‍ය වන්නේ ප්‍රභාකරන්ගේ ජීවිතය රැකදීම ය. ඔහු හමුදා මෙහෙයුම්වලට විරුද්ධවන්නේ ඒ අරමුණින් බව අමුතුවෙන් කිවයුතු නො වේ.

කරුණානිධි ලංකාවේ තබා මෙරට දෙමළ ජනයාගේ හිතවතකුවත් නොවන බව පැහැදිලි ය. ඔහුට මෙරට සිටින එකම දෙමළ මිනිසා ප්‍රභාකරන් ය. හිටපු ඉන්දීය අගමැතිවරයකු වූ රජිව් ගාන්ධි මහතා ඝාතනය කරනු ලැබුයේ ප්‍රභාකරන්ගේ තීරණයක් අනුව ය. ඒ ඝාතනය සිදු වූ අවස්ථාවේ ද තමිල්නාඩුවේ මහා ඇමති ව සිටියේ කරුණානිධි ය. මා මෙයින් අදහස් කරන්නේ කරුණානිධි ඒ ඝාතනයට සම්බන්ධ බව නො වේ. එහෙත් ඔහුට අඩුම තරමින් ඒ සම්බන්ධයෙන් ප්‍රභාකරන්ට දඩුවම් ලබා දීමේ සදාචාරාත්මක වගකීමක් වෙයි. එහෙත් ඔහු සූදානම් වන්නේ රජිව් ගාන්ධි ඝාතනය සම්බන්ධ ප්‍රධාන වගකිවයුත්තාගේ ජීවිතය බේරාගැනීම ය. කරුණානිධි අඩුම තරමින් ඉන්දියාවේවත් හිතවතෙක් නො වෙයි.

හමුදා විසඳුම් ද දේශපාලන විසඳුම් වෙයි. හමුදා ක්‍රියාමාර්ග ද දේශපාලන ක්‍රියාමාර්ග වෙයි. කොටින්ට විරුද්ධව කෙරෙන මානුෂික මෙහෙයුම් ද දේශපාලන විසඳුමක කොටසක් වෙයි. අද කොටි වෙන ම රාජ්‍යයක් පිහිටුවීම සඳහා ආයුධ අතට ගෙන ඇත. කොටි හමුදා ක්‍රියාමාර්ගයකින් පරාජය කළයුතු බව හා පරාජය කළහැකි බව අප කියන්නේ අවුරුදු විස්සකට වැඩි කාලයක් තිස්සේ ය. එකල අද යුද වීරයන් බවට පත්වී ඇති බොහෝ දෙනා ද අපට විරුද්ධව යුදවාදී ආදී විශේෂණ පද යෙදූහ. ලක්මිණ නමින් පළවූ පුවත්පතට ලියූ අයට ඒ අමතක විය නො හැකි ය.

ඒ දිනවල සිට ම මෙන් අප කියා සිටියේ මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයක් නොමැති බව ය. දෙමළ ජනයාට දෙමළ වීම නිසා පමණක් සිදු වූ අසාධාරණය කුමක් දැයි අපි ඇසුවෙමු. එයට අද වනතුරුත් පිළිතුරක් නැත. එවැනි ප්‍රශ්න තිබුණ ද පළාත්වලට හෝ වෙනත් ඒකකයකට හෝ බලය බෙදීමෙන් ඒ ප්‍රශ්න විසඳාගත හැක්කේ කෙසේ දැයි අපි ඇසුවෙමු. එයට හේතුව දෙමළ ජනයාගෙන් බහුතරය උතුරු හා නැගෙනහිර පළාත්වලින් බැහැර ව ජීවත්වීම ය. විසඳීමට ඇති ඊනියා ප්‍රශ්නය කුමක් දැයි කිසිම පඬියකු තවමත් පැහැදිළි ව දක්වා නැත. දෙමළ ජනයාට යම් යම් අපේක්ෂා ඇත. ඒ අපේක්ෂා ඇතැම්විට බොරුව මත පදනම් වී ඇත. ඒ කෙසේ වෙතත් සංවර්ධනය ඉලක්ක කරගනිමින් එසේ නොවන අපේක්ෂාවලට පිළිතුරු සෙවිය හැකි ය. අද සර්වපාක්ෂික නියෝජිත කමිටුවෙන් කළ යුත්තේ එවැන්නකි. ඒ කටයුත්ත හමුදා මෙහෙයුම්වලට අමතර ව ය. ඒ කෙසේ වෙතත් එවැනි සාකච්ඡාවක් අද කෙරීගෙන යයි. එබැවින් කොටි ත්‍රස්තවාදීන් සමග රට බෙදීම සම්බන්ධව හෝ එයට විකල්පයක් ලෙස හෝ සාකච්ජා අනවශ්‍ය ය. කළ යුත්තේ කොටි හමුදා මෙහෙයුම්වලින් පරාජය කිරීමත් කරුණානිධිගේ උප්පරවැට්ටි පරාජය කිරීමත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva